# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07

විභාග පූර්ව පරීක්ෂණය (අ.පො.ස. උ/පෙළ)
13 ශ්‍රේණිය
සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය
2016 ජුනි

කාලය පැය 02 යි

නම:- ................................................ අංකය:-.............................. පන්තිය:-........

## I කොටස

**උපදෙස්**

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 50කින් සමන්විත වේ.
- එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.
- නිවැරදි පිළිතුර තෝරා තිත් ඉරි මත අංකය ලකුණු කරන්න.

---

**1-17 දක්වා ඇති ප්‍රශ්නවලට නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.**

1. සන්නිවේදන කාර්යය සාර්ථක වීමට නම් සන්නිවේදකයාත් ග්‍රාහකයාත් අතර සමාජ ක්‍රමය, දැනුම, ආකල්ප ආදී සාධක ගැළපිය යුතුය. මේ අදහසට ගැළපෙන සන්නිවේදන ආකෘතිය වන්නේ,
   1) ලැස්වෙල් ආකෘතිය
   2) බර්ලෝ ආකෘතිය
   3) ෂැනොන් වීවර් ආකෘතිය
   4) ශ්‍රාම්ඔස්ගුඩ් ආකෘතිය
   5) ඉහත කිසිවක් නොවේ.

2. A) සන්නිවේදකයාත් ග්‍රාහකයාත් අතර ඇත්තේ නිෂ්පුද්ගල සම්බන්ධයකි.
   B) සන්නිවේදකයා හැම විටම සන්නිවේදන විෂයේ පුහුණුවක් ලද්දෙකි.
   C) සංදේශය සැමවිටම පොදු වූවකි.

   ඉහත ලක්ෂණ සහිත සන්නිවේදන ප්‍රභවය වන්නේ,
   1) අන්තර් පුද්ගල සන්නිවේදනය
   2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
   3) සමූහ සන්නිවේදනය
   4) ජන සන්නිවේදනය
   5) ගෝලීය සන්නිවේදනය

3. පොදු දේපළ ක්‍රමය ක්‍රියාත්මක වන එම රාජ්‍යයේ ක්‍රියාත්මක වන්නේ එක් පක්ෂයකි. එම පක්ෂයේ අභිමතය පරිදි ජනමතය ක්‍රියාත්මක වේ. මෙහිදී ක්‍රියාත්මක වන සන්නිවේදන සංකල්පය වන්නේ,
   1) අධිපතිවාදී සන්නිවේදන සංකල්පය
   2) සෝවියට් කොමියුනිස්ට්වාදී සන්නිවේදන සංකල්පය
   3) සමාජ වගකීම් සන්නිවේදන සංකල්පය
   4) නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය
   5) සංවර්ධනාත්මක සන්නිවේදන සංකල්පය

4. සන්නිවේදන ක්‍රියාවලිය තුළ සංජානන සුවිශේෂී කාර්යයකි. සංජානනය පිළිබඳ සදොස් වාක්‍ය වන්නේ,

1) සංජානනය පංචේන්ද්‍රියන් හා බැඳී පවතී
2) මනසේ සිදුවන තොරතුරු විශ්ලේෂණ ක්‍රියාවලියකි.
3) පුද්ගල ඉන්ද්‍රිය බද්ධ නොවූ ක්‍රියාවලියකි.
4) ලැබෙන තොරතුරක් මනසින් තේරුම් ගැනීමයි.
5) ලැබෙන තොරතුරක් මනසින් තේරුම් ගැනීමයි.

5. පුද්ගල ආත්මභාෂණය පෝෂණය කිරීමට සෘජුව සම්බන්ධ වන උපකරණ ලෙස සැලකිය හැක්කේ,

1) සුදු ලෑල්ල, කළු ලෑල්ල, බහුමාධ්‍ය උපකරණ
2) පුවත්පත, ගුවන් විදුලිය, රූපවාහිනිය
3) ඇස, කණ, ශරීරය
4) පොත්, සඟරා, පුවත්පත්
5) අන්තර්ජාලය, සමාජ මාධ්‍ය, රූපවාහිනිය

6. කිසියම් සංදේශයක් සංඥා ලෙස ග්‍රාහක අන්තයට පැමිණ නැවත සංදේශය බවට පත්වීම

1) සම්ප්‍රේෂණයයි.
2) සංදේශයයි.
3) ආකේතකරණයයි.
4) විකේතකරණයයි.
5) ප්‍රතිපෝෂණයයි.

7. ඩේවිඩ් කේ. බර්ලෝ ආකෘතිය අනෙක් සන්නිවේදන ආකෘතිවලට වඩා වෙනස් වන්නේ,

1) ශබ්ද මූලය ඔස්සේ සන්නිවේදන බාධක මුලින්ම හඳුන්වා දුන් නිසයි.
2) ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය, චර්යාවන් හා සමාජය අතර සබඳතාවය පෙන්වන නිසයි.
3) අනෙක් ආකෘති මෙන් ප්‍රතිපෝෂණ කාර්යය පෙන්වා දී නැති නිසයි.
4) සන්නිවේදනයට අත්දැකීම් පසුතලය බලපාන අයුරු පෙන්වා දී ඇති නිසයි.
5) සන්නිවේදනය චක්‍රීය ක්‍රියාදාමයයක් බව ඔප්පු කරන නිසයි.

8. පුවත්පතක තිබූ උසස් පෙළ පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය ලියාගත් රවී එය මිතුරා දමිත්ට ද පිටපත් ලබාදී ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට පටන් ගත්තේය. මෙහිදී අදාළ වන සන්නිවේදන වර්ග පිළිවෙළින්.

1) ජනසන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය, අන්තර්වර්ති සන්නිවේදනය
2) ජනසන්නිවේදනය, අන්තර්වර්ති සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය
3) ලිඛිත සන්නිවේදනය, අන්තර්වර්ති සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය
4) අන්තර්වර්ති සන්නිවේදනය, ජන සන්නිවේදනය, ලිඛිත සන්නිවේදනය
5) ජනසන්නිවේදනය, ලිඛිත සන්නිවේදනය, අන්තර්වර්ති සන්නිවේදනය

9. A) උසස් සන්නිවේදන මට්ටමක් ඇති වේ.
B) අර්ථය බාධාවකින් තොරව සංජානනය වේ.

C) වඩාත් හෙඳින් හැඟීම් හා භාවයන් ප්‍රකාශ කළ හැකි වේ.

ඉහත ලක්ෂණ සහිත වඩාත් සමීප වන්නේ,

1) රූපවාහිනී මාධ්‍යයට ය.
2) ශ්‍රව්‍ය මාධ්‍යයක් වන ගුවන්විදුලියට ය.
3) පරිකල්පන ශක්තිය උපරිමයෙන් ලබාදෙන මුද්‍රිත මාධ්‍යවලට ය.
4) දෘෂ්‍ය මාධ්‍යයන්ට ය.
5) අචාචික සන්නිවේදන මාධ්‍යයන්ට ය.

10. A) සමාජ හිතකාමී කටයුත්තකට එක් වෙයි.
B) ඉගෙනුම් කාර්යයක් සඳහා එක් වෙයි.
C) තීරණ ගැනීමේ කටයුත්තකට දායක වෙයි.
D) සමාන චිත්තවේග ක්‍රියාත්මක වීමෙන් එක්ව කටයුතු කරයි.

ඉහත සඳහන් සමූහ පිළිවෙළින් හැඳින්වූ විට,

1) ක්‍රියාකාරී, ඉගෙනුම්, ප්‍රතිපත්ති සැකසුම්, විශෝධන
2) විශෝධන, ඉගෙනුම්, ප්‍රතිපත්ති සැකසුම්, ක්‍රියාකාරී
3) අහඹු, ක්‍රියාකාරී, ඉගෙනුම්, ප්‍රතිපත්ති, සැකසුම්
4) විශෝධන, ක්‍රියාකාරී, අහඹු, ප්‍රතිපත්ති සැකසුම්
5) ක්‍රියාකාරී, ඉගෙනුම් ප්‍රතිපත්ති සැකසුම්, අහඹු

11. විද්‍යාලයේ කලා සංගමය තුළ ගැටලු සහගත පසුබිමක් නිර්මාණය වූයේ එහි තේමාවට ඇතැමෙක් විරුද්ධ වූ නිසයි. ඒ සඳහා ගතහැකි හොඳම පියවරක් වන්නේ,

1) කලා සංගමයේ නිලධාරී මණ්ඩලය අහෝසි කිරීමයි.
2) විදුහල්පතිතුමාගේ තීරණය අවසාන තීරණය ලෙස සැලකීමයි.
3) සියලු දෙනාම කැඳවා විසම්මුතියට ඉඩ දී ඒ තුළින් එකගත්වයකට පැමිණීමයි.
4) විසම්මුතියට ඉඩ ලබාදී එය ක්‍රියාත්මක කිරීමයි.
5) විසම්මුතිධාරීන් සංගමයෙන් තෙරපා හැරීමට යෝජනා සම්මත කර ගැනීමයි.

12. ස්ව සංකල්පය යනු පුද්ගලයෙකු ඔහු පිළිබඳව සත්‍ය ලෙස සලකනු ලබන වටිනාකම්වල හා විශ්වාසයන්ගෙන් සකස් වූ සංකීර්ණ ක්‍රියාකාරී පද්ධතියකි. මෙම නිර්වචනය ඉදිරිපත් කළේ,

1) රොජර්ස් ය.
2) බර්න් ය.
3) පර්කි ය.
4) මැලිනොව්ස්කි ය.
5) ටයිලර් ය.

13. ගෝලීයකරණයේ මුඛ්‍ය ඵලයක් ලෙස හැඳින්විය හැක්කේ,

1) ජාතික රාජ්‍යවල ස්වාධීනත්වය බිඳ වැටීම
2) නව ලිබරල් වාදය
3) තරගකාරීත්වය
4) සංස්කෘතික සුරක්ෂිතතාවය
5) කලාපීයකරණය

14. A) මහජන ප්‍රචණ්ත්තිකරණයකි.
B) නූතන බහුජන මාධ්‍ය විරෝධී ආකල්ප දරයි.
C) සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය උත්කර්ෂණය කරයි.
D) සමාජය වෙනස් දිශාවකට යොමු කරන්නට තැත් කරයි.
E) පුද්ගල ජන ජීවිතය උසස් මට්ටමකට ගෙන ඒමට ක්‍රියාත්මක වේ.

ඉහත කී ලක්ෂණ අතරින් පුරවැසි මාධ්‍යයට අදාළ වන ලක්ෂණ අඩංගු වරණය වන්නේ,

1) A,B,C 2) C,D,E 3) A,C,E 4) B,D 5) A, E

15. ඉහත කී ලක්ෂණ අතරින් විකල්ප සහ විරෝධාකල්ප මාධ්‍යයක දැකිය හැකි ලක්ෂණ අඩංගු වරණය වන්නේ,

1) B,C,D 2) C,D,E 3) A,B 4) B,D,E 5) B,C,D

16. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේදී බලහත්කාරයෙන් මෙරට පිරිවෙන් අධ්‍යයන ක්‍රමය විනාශ කර මිෂනාරි අධ්‍යාපනය රට පුරා ව්‍යාප්ත කරන ලදී. මෙය,

1) සංස්කෘතික විසරණයයි.
2) විරෝධී සංස්කෘතියයි.
3) සංස්කෘතික ත්වර්ණයයි.
4) බහිර් සංස්කෘතිකරණයයි.
5) සංස්කෘතික රාශි කෘතියයි.

17. මාධ්‍ය සංස්කෘතියේ හා වෙළඳපොළ ව්‍යාප්තියේ සෘජු බලපෑමක් වශයෙන් හැඳින්විය නොහැක්කේ,

1) ආත්ම කේන්ද්‍රීය මාද්‍ය බිහිවීම
2) සාම්ප්‍රදායික සංස්කෘතික මතවාද යටපත් වීම
3) සමාජයීය හා පුද්ගල චර්යාවන් අවශ්‍ය ලෙස වෙනස් වීම.
4) ව්‍යාපාරික අවශ්‍යතා අනුව මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක වීම.
5) ලොව පුරා බටහිර සංස්කෘතික මතවාද පැතිරවීම.

18. යම් සමාජයක සාම්ප්‍රදායික ජන සංස්කෘතිය ඉතා බලවත් ව පවතින විට මාද්‍ය සංස්කෘතියේ හැසිරීම

1) වඩා දුර්වල වේ.
2) වඩා බලවත් වේ.
3) සම්ප්‍රදායන් හා එක්ව කටයුතු කරයි.
4)වගකීමෙන් තොරව කටයුතු කරයි.
5) දැඩි බලපෑමක් ජන සංස්කෘතියට එල්ල කරයි.

19. සංවර්ධන සන්නිවේදනයේදී නවීකරණයට කිසිසේත් එකඟ නොවන කණ්ඩායම් සම්බන්ධයෙන් ගත හැකි පියවර වන්නේ,

1) ඔවුන්ගේ බාධාකිරීම්වලට එරෙහිව නීතිමය පියවර ගැනීමයි.
2) ඔවුන්ට වෙනස් වීමට කාලය ලබාදීමයි.
3) ඔවුන්ගේ බාධාකිරීම් මග හැරීමට අවශ්‍ය උපක්‍රම යොදාගැනීමයි.

4) සංවර්ධන සංදේශන ප්‍රවර්ධන සැලසුමක් සඳහා ඔවුන් යොදාගැනීමයි.

5) ඔවුනට හුරුපුරුදු සාම්ප්‍රදායික මාධ්‍ය යොදාගැනීමෙන් ඔවුන් පොළඹවා ගැනීමයි.

20. සංවර්ධන සන්නිවේදනයේදී ප්‍රජා සහභාගිත්ව ක්‍රමවේදය ඵලදායී වේ. ඒ අනුව ප්‍රජා සහභාගිත්වය අවශ්‍ය නොවන්නේ,

1) සැලසුම් කිරීමට ය.
2) නියාමනයට ය.
3) වැඩ කිරීමට ය.
4) ඇගයීමට ය.
5) විශේෂඥ සේවය ලබාදීමට ය.

21. සාම්ප්‍රදායික සංවර්ධන සන්නිවේදන ක්‍රම පිළිබඳ සාවද්‍ය මතය වන්නේ,

1) ඒවා ජනතාවට හුරුපුරුදු සංකේත වන බවයි.

2) බලි තොවිල් වැනි සාම්ප්‍රදායික යාතුකර්ම තුළින් කාර්යක්ෂම සන්නිවේදනයක් ඉටුවන බවයි.

3) සාම්ප්‍රදායික හා නූතන සන්නිවේදන ක්‍රම මිශ්‍රකර සංදේශ නිර්මාණය කළ හැකි බව

4) තාක්ෂණික මාධ්‍ය, සාම්ප්‍රදායික මාධ්‍යවලට වඩා ගැමි ප්‍රජාව අගයන බවයි.

5) සාම්ප්‍රදායික මාද්‍ය කෙරේ ක්‍රියාකාරී ග්‍රාහක ප්‍රතිචාර ලබාගත හැකි බවයි.

22. සංවර්ධන සන්නිවේදනය පිළිබඳ දේශපාලන හා සංස්කෘතික ගැටලුවකි.

1) පෙරදිග සමාජවල ආවේණික ස්වායි බව.

2) ජාතික චින්තනයක් හෝ ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීම

3) පුරවැසි සමාජ වගකීම් පිළිබඳ දියුණු දැක්මක් නොමැති වීම

4) දැඩි ආගමික කේන්ද්‍රීය බව.

5) පාරිසරික හා භූගෝලීය තත්ත්වයන් ආකල්ප කෙරේ බලපෑම.

23. සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘතියක අවසන් වාර්තාවට ඇතුළත් නොකළ යුතු කරුණක් වන්නේ,

1) ඉලක්කයට ළඟාවීමේදී නියාමනය කළ ආකාරය

2) අයවැය පාලනය හා සම්පත් උපයෝජනය පිළිබඳ

3) ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ඵල

4) සාර්ථකත්වයට නැතහොත් අසාර්ථකත්වයට බලපෑ හේතු පිළිබඳව

5) මුහුණපාන්නනට සිදුවූ ගැටලු හා අතපසු වීම්

24. පුවත්පතක පළ වී තිබූ ලිපියක පහත දැක්වෙන වාක්‍ය ඇතුළත් ව තිබිණි. ඒවායින් නිවැරදි වාක්‍ය වන්නේ,

1) වඩාත් ගැළපෙන විසඳුම ලබාදීමට සභාපතිතුමන් එකඟ වූහ.

2) සියල්ලන්ටම අතිකාල දීමනා ලබාදීමට සභාපතිතුමන් එකඟ වූහ.

3) සේවකයන් දියත් කළ වැඩ වර්ජනය පිළිබඳ කළමනාකරුවෝ කරුණු ඉදිරිපත් කළහ.

4) වෘත්තීය සමිති වැඩ වර්ජනය සංවිධානය කළේය.

5) මාධ්‍යකරුවන් ද රජයේ නියෝජිතයන් ද සටනට මැදි වූහ.

25. එකිනෙකට ප්‍රතිවිරුද්ධ මතයක් හෝ දෙදක් හෝ කීපයක් අතර ඇතිවන සම්බන්ධය

1) සංජානනය වේ.
2) සන්නිවේදනයයි.
3) සහුවේදනයයි.
4) ද්විමාර්ගික සන්නිවේදනය වේ.
5) ගැටුම වේ.

26. යම් දෙපාර්ශවයක් අතර ඇතිවන ගැටුමකදී අතුරු ලාභ ලබන ගැටුම දිගටම පවත්වාගෙන යාමට අන් අය පොළඹවන පිරිස හඳුන්වන්නේ,

1) ඍජු පාර්ශවකරු ලෙස
2) වක්‍ර කළමනාකරුවන් ලෙස
3) මැදිහත්කරුවන් ලෙස
4) කළමනාකරුවන් ලෙස
5) විරෝධී පාර්ශවකරුවන් ලෙස

27. සිග්මන් ෆ්‍රොයිඩ් ගේ මනෝ විශ්ලේෂණවාදී ආකෘතියට අනුව ප්‍රචණ්ඩත්වයට ආකර්ෂණය වීමේ ලක්ෂණය දැකිය හැකි වන්නේ,

1) සුපහන් සිතෙහි ය.
2) පහන් සිතෙහි ය.
3) යටි සිතෙහි ය.
4) සමානාත්මක සිතෙහි ය.
5) ධනාත්මක සිතෙහි ය.

28. ගෘහස්ත සාමය කළමනාකරණය කර ගැනීමට අනුගමනය <u>නොකළ</u> යුතු ක්‍රියාමාර්ගය වන්නේ

1) ගෘහයේ සාමාජිකයන්ගේ දෝෂ හා අඩුපාඩු ඉස්මතු කර ගනිමින් ඒ පිළිබඳ නිරන්තරයෙන් සැලකිලිමත් වීම
2) ගෘහස්ථ සාමාජිකයන් හෝ ගෘහය වෙනත් ගෘහයන්ගෙන් හෝ එහි සාමාජිකයන් සමග සැසඳීමෙන් වැලකීම
3) ගෘහයේ සාමාජිකයන්ගේ අඩුපාඩු ප්‍රස්ථාපනය කර ගැනීමට එකිනෙකට උපකාර කිරීම
4) ස්වභාවික පරිසරයට ආදරය කිරීමට පුරුදු වීම
5) ගෘහයේ සාමාජිකයන්ට මොනම ආකාරයකින්වත් අවමානයක් සමච්චලයක් සිදුනොකිරීම.

29. ප්‍රචණ්ඩකාරී වැඩසටහන් සමාජය පුරා ඉතා ඉක්මනින් ජනප්‍රිය වීමට බලපාන ප්‍රධාන හේතුවකි.

1) රූපමාධ්‍යයේ ප්‍රබලත්වය
2) ශ්‍රව්‍ය. මාධ්‍යයේ ප්‍රබලත්වය
3) මාධ්‍ය සංදේශවල ඇති සංවේදීතාවය
4) සෞන්දර්යාත්මක සංදේශ වීම
5) මාධ්‍ය සාක්ෂරතාවය ග්‍රාහකයන් තුළ නොමැති වීම

30. අනෙක් ජනමාධ්‍යවලට සාපේක්ෂව ප්‍රචණ්ඩත්වය අඩුවෙන් ඉදිරිපත් වන මාධ්‍යය ලෙස සැලකිය හැක්කේ

1) පුවත්පත
2) රූපවාහිනිය
3) ගුවන්විදුලිය
4) සිනමාව
5) නව මාධ්‍ය

31. මාධ්‍ය සාක්ෂරතාවය ඇතිවීමෙන් පුද්ගලයා තුළ ඇති වන පෞද්ගලික සංවර්ධනීය ගුණාංග වන්නේ

1) ආත්ම විශ්වාසය, ස්වයං දෘෂ්ටිය, සවිඥානක බව
2) විචාරශීලී චින්තනය, මධ්‍යස්ථ බව, ඇගයීමේ කුශලතාවය
3) ස්වයං දෘෂ්ටිය, බුද්ධිගෝචර බව, සවිඥානක බව
4) සවිඥානක බව, ගැටලු විසඳීමේ හැකි බව, විචාරශීලී චින්තනය
5) මානසික සාමය, මධ්‍යස්ථ බව, සවිඥානක බව.

32. මාධ්‍ය සාක්ෂරතාවය නිපුණතා පාදක වේ. එම නිපුණතා අතරට අයත් නොවන්නේ,

1) මාධ්‍යවල අන්තර්ගයන් නිෂ්පාදනය කරන්නේ කෙසේදැයි අවබෝධ කර ගැනීම
2) හිංසාකාරී හෝ අනාරාධිත මාධ්‍ය සංදේශ බැහැර කිරීමට හැකි වීම
3) ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකමක් ලෙස මාධ්‍ය ඵලදායී ලෙස භාවිතා කිරීම.
4) මාධ්‍ය සංදේශවලට අනුරූප ලෙස තම දෛනික න්‍යායපත්‍රය යථාර්ථවාදී කරගැනීම
5) අදහස්, තොරතුරු හා මතයන් සන්නිවේදන කිරීම සඳහා මාධ්‍ය නිර්මාණශීලී ව යොදාගැනීම

33. සුනිමල් රූපවාහිනී දැන්වීමකින් විදේශීය රටක අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාගත්තේය. එය ඉගෙනුම් මෙවලමක් ලෙස,

1) මෙහෙයුම් සංදේශයකි.
2) නඩත්තු සන්දේශයකි.
3) ශක්තිජනක සංදේශයකි.
4) මෙහෙයුම් හා නඩත්තු සංදේශයකි.
5) ඉහත කිසිවක් නොවේ.

40. නිර්මාණයක ස්වීයත්වය පිළිබඳ වඩාත් නිවැරදි අදහස වන්නේ,

1) නිර්මාණයක ස්වීයත්වය නිරූපණය වනනේ නිර්මාණකරුගේ අනන්‍යතාවය තුළ නිරූපණය කිරීමේ හැකියාව තුළිනි.
2) නිර්මාණකරුවෙකුගේ ස්වීයත්වය බොහෝවිට ග්‍රාහකයා හඳුනා ගනියි.
3) නිර්මාණාත්මක ස්වීයත්වය ඉස්මතු වන්නේ ලේඛනය තුළින් පමණි.
4) නිර්මාණකරුවෙකුට අනන්‍යතාවයක් ගොඩ නගා ගැනීම ඉතා කෙටිකාලයකදී වුවද සිදුකළ හැකිය.
5) නිර්මාණාත්මක ස්වීයත්වය නිරූපණය වන දේශීය නිර්මාණ ඉතා විරල ය.

41. මාධ්‍ය විචාරයේ මූලිකාංග වන්නේ

1) විචාර ක්‍රමවේද, මාධ්‍ය නිර්මාණ, මාධ්‍යකරුවා. ග්‍රාහකයා, විචාරකයා
2) මාධ්‍ය නිර්මාණය, මාධ්‍යකරුවා, මාධ්‍යය, ග්‍රාහකයා, විචාරකයා
3) විචාර ක්‍රමෝපාය, නිර්මාණ මූලාශ්‍රය, නිර්මාණ මාධ්‍යය, විචාරකයා
4) විචාර ක්‍රමෝපාය, නිර්මාණ මූලාශ්‍රය, නිර්මාණ මාධ්‍ය, විචාරකයා
5) මාධ්‍ය සංදේශය, මාධ්‍ය නිර්මාණ, මාධ්‍යය, විචාරකයා

42. මාධ්‍ය විචාරකයාගේ කාර්යයක් නොවන්නේ

1) දෘෂ්ටිමය වාදී සන්නිවේදනයක් ඉදිරිපත් කිරීම
2) සමාජ සංස්කෘතියේ වෘද්ධිය සඳහා කටයුතු කිරීම
3) සමාජයීය ප්‍රවේශයන්ට අනුගත වී නිර්මාණ කිරීමට මග පෙන්වීම
4) ග්‍රාහක රසඥතාවය ඉහළ නැංවීමට විනෝදය සැපයීම
5) මාධ්‍යයේ සුවිශේෂතා අනුව මාධ්‍ය නිර්මාණයේ හැඩරුව විනිශ්චය කිරීම

43. මාධ්‍ය විචාරය සමාජයට අවශ්‍ය වන්නේ

1) මාධ්‍ය සංදේශයක් විනිවිද දැකීමට සාමාන්‍ය ජනයාට ඇති හැකියාව අවම නිසා ය.
2) ග්‍රාහකයාගේ සංජානන හැකියාව ඉහළ මට්ටමක පවත්වා ගැනීමයි.
3) නිර්මාණකරුවන් තම නිර්මාණය දෙස පුළුල් විමර්ශනයක් කිරීමට හැකියාව ඉන් ලැබෙන නිසා ය.
4) සාමාජයීය ප්‍රවේශයන්ට අනුගාමී ව මාධ්‍ය නිර්මාණ දිශාගත කිරීමට අවශ්‍ය මගපෙන්වීම මාධ්‍ය විචාරයෙන් ලැබෙන නිසාය.
5) ඉහත සියලුම කරුණු නිසා ය.

44. A) අඳුර සමග එක්වූ මාධ්‍යයකි.
B) නිර්මාණ වෘත්තාන්තමය ස්වරූපයක් ගනියි.
C) විවිධ අන්තර්ගතයන්, ආකෘතීන්, ශෛලීන් නිර්මාණ සඳහා යොදාගන්නා ලදී.
D) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි.

ඉහත ලක්ෂණ සහිත වඩාත් සමීප වන්නේ,

1) රූපවාහිනී මාධ්‍යයට රීතියට ය.
2) චලන මාධ්‍ය රීතියට ය.
3) ගුවන් විදුලි මාධ්‍ය රීතියට ය.
4) මුද්‍රිත මාධ්‍ය රීතියට ය.
5) බහුජන මාධ්‍ය රීතිය වය.

45. කිසියම් මාධ්‍ය නිර්මාණයක ඇති කලාත්මක සංකල්ප, ශිල්පීය ක්‍රම ආදිය තක්සේරු කෙරෙන්නේ,

1) සංසන්දනාත්මක හා විශ්ලේෂණාත්මක ප්‍රවේශය මගිනි.
2) සෞන්දර්යාත්මක ප්‍රවේශය මගිනි.
3) භාෂාත්මක ප්‍රවේශය මගිනි.
4) සදාචාරාත්මක ප්‍රවේශය මගිනි.
5) දේශපාලනික ප්‍රවේශය මගිනි.

46. නිර්මාණාත්මක සන්නිවේදනයේදී සංදේශ සැලසුම් කිරීම පිළිබඳ හැකියාව ලැබෙන පුළුල් මග පෙන්වීමක් ලබාදෙන්නේ,

1) ලැස්වෙල් ආකෘතියයි.
2) ෂැනන් වීවර් ආකෘතියයි.
3) ඇරිස්ටෝටල් ආකෘතියයි.
4) ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතියයි.
5) බර්ලෝ ආකෘතියයි.

47. පහත සඳහන් සංදේශ අතරින් නිර්මාණාත්මක සංදේශයක් ලෙස නොසලකන්නේ

1) රූපවාහිනී ප්‍රවෘත්ති
2) රූපවාහිනී වෙළඳ දැන්වීම්
3) නවකතා
4) ගුවන්විදුලි නාට්‍ය
5) චිත්‍රපට

48. ප්‍රජා ගුවන්විදුලි නාට්‍ය භාවිතයේ ලක්ෂණයක් නොවන්නේ

1) මාධ්‍ය හිමිකාරිත්වය ප්‍රජාව සතුවීම
2) වෘත්තිය සන්නිවේදකයන් නොසිටීම
3) ප්‍රජාවගේ එදිනෙදා සංවර්ධන ක්‍රියාකාරකම් පදනම් වීම
4) අනුග්‍රාහක ආයතනවලට යම් කාලයක් වෙන් කර දීම
5) ප්‍රජාවගේ සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනයට නැඹුරුවක් දැක්වීම

49. නිර්මාණශීලී රූපණ සම්ප්‍රදායකි.

1) ආංගික
2) සාත්වික
3) තාත්වික
4) වාචික
5) ආහාර්ය

50. කියන්නා කෙසේ කිවත් අසන්නා සිහිබුද්ධියෙන් ඇසිය යුතුය යන ප්‍රකාශයෙන් කියැවෙන්නේ

1) විචාරශීලි ග්‍රාහකත්වය පිළිබඳවයි.
2) අර්ථ බාධක පිළිබඳවයි
3) නිවැරදි ආකේතකරණය පිළිබඳවයි.
4) සහවේදනය පිළිබඳවයි.
5) ආචාරශීලි බව පිළිබඳවයි.

# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07

විභාග පූර්ව පරීක්ෂණය (අ.පො.ස. උ/පෙළ)
13 ශ්‍රේණිය
**සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය**
II කොටස
2016 ජූනි

*කාලය පැය 03 යි*

නම:- .................................................. අංකය:-.............................. පන්තිය:-........

❖ **ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**

01) 1) කිසියම් සංදේශයක් අර්ථකථනය කර ගැනීමත්, පසුව ඊට ප්‍රතිපෝෂණය ලබාදීමත් යන ක්‍රියාවලින් ඉතා සරලව ඉදිරිපත් කෙරෙන සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කළේ කවුරුන් විසින්ද? (ලකුණු 2)

2) එම ආකෘතිය ඇඳ කොටස් නම් කර එහි දැකිය හැකි දුර්වලතාවයන් දක්වන්න. (ලකුණු 4)

3) සමූහ සන්නිවේදනයකදී එය සාර්ථක කර ගැනීමට සන්නිවේදකයාට යොදාගත හැකි උපක්‍රම තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 6)

4) ජනසන්නිවේදනයේ ලක්ෂණ හතරක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 8)

02) උපුල් ගුවන්විදුලි නාලිකාවක නිවේදකයෙකු වේ. ළග එන මැතිවරණය තේමා කර ගනිමින් සජීවී දේශපාලන සංවාදයක් ඔහු විසින් මෙහෙයවන ලදී.

1) ගුවන් විදුලි මාධ්‍ය තුළ භාෂා භාවිතයේදී සැලකිලිමත් විය යුතු කරුණු 4 ක් නම්කරන්න. (ලකුණු 2)

2) ගුවන් විදුලි වැඩසටහනකදී භාවිතා කළ නොහැකි අවාචික සන්නිවේදන විධික්‍රම හතරක් දක්වා ඒවා දෛනිකව ජීවිතයේදී භාවිතා කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

3) ගුවන්විදුලි මාධ්‍ය තුළ භාවිතා වන භාෂාවේ භාවිත ප්‍රභේද දෙකක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 6)

4) උපුල්ට තම වැඩසටහන පිළිබඳ ප්‍රතිපෝෂණය ලබාගත හැකි විධික්‍රම දෙකක් සහ ප්‍රතිපෝෂණයෙන් ග්‍රාහකයාට ලැබෙන වාසි දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 8)

03) නිමල්, තම ගම්මානයේ අබලන් වූ දුෂ්කර මාර්ගය පිළිබඳ ඡායාරූප ද සහිත විස්තරයක අන්තර්ජාලයේ එක්තරා සමාජ ජාලයක වාර්තා කළේය.

1) මෙම වාර්තාකරණය කුමක්දැයි නම් කරන්න. එහි ලක්ෂණ 3 ක් නම් කරන්න. (ලකුණු 2)

2) සාමාන්‍ය පුවත්පත්වල තොරතුරු වාර්තාකරණය සහ අන්තර්ජාල තොරතුරු වාර්තාකරණය අතර දැකිය හැකි වෙනස්කම් හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

3) රටක ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍යයන්ට පරිබාහිරව ක්‍රියාත්මක වන ජනමාධ්‍ය ශෛලියක් වන විකල්ප මාධ්‍යවල ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ලකුණු 6)

4) සන්නිවේදන ගෝලීයකරණය නිසා තුන්වන ලෝකයේ රටවල සන්නිවේදන ක්ෂේත්‍රයෙහි සිදුවී ඇති වෙනස්කම් හතරක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 8)

04) ඔබ එක්තරා පෞද්ගලික ආයතනයක මහජන සම්බන්ධතා නිලධාරියා යැයි සිතන්න.

1) මහජන සම්බන්ධතා විධික්‍රමයක් ලෙස සාර්ථක මාධ්‍ය සම්බන්ධතාවක් සඳහා වූ මූලධර්ම දෙකක් නම් කරන්න. (ලකුණු 2)

2) දිනක් ආයතනයේ සේවක දෙපිරිසක් අතර ඇතිවූ ගැටුමකදී ඔබට මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරන්නට සිදුවිය. එහිදී ඔබ විසින් සිදුකරන කාර්යයන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

3) ඔබගේ ආයතනය මගින් නිෂ්පාදිත නවතම නිෂ්පාදනයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකාවක් මුද්‍රණය කිරීමට තීරණය වුණි. එය වඩා ප්‍රශස්ත ලේඛනයක් බවට පත්කර ගැනීමට නම් ඔබ විනිස් සැලකිලිමත් විය යුතු කරුණු තුනක් විස්තර කරන්න. (ලකුණු 6)

4) මහජන සම්බන්ධතාවය දැන්වීම්කරණයෙන් වෙනස් වන ආකාරය දක්වා, දැන්වීම්කරණයෙන් සමාජයට සිදුවන අහිතකර බලෑම් තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 8)

05) සංවර්ධනය කරා ගමන් කරමින් සිටින තුන්වැනි ලෝකයේ රටවල් මාධ්‍ය සංස්කෘතිය මගින් සිදුකරන අයහපත් බලපෑම ඉතාම දැඩි ය.

1) මාධ්‍ය සංස්කෘතිය යනු කුමක්ද? (ලකුණු 2)

2) මාධ්‍ය සංස්කෘතිය මගින් සමාජයට සිදුවන අහිතකර බලපෑම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 4)

3) සංවර්ධනය කරා යන ගමනේදී එම රටේ ජනමාධ්‍යයන්ට ඒ සඳහා දිය හැකි දායකත්වය බොහෝ ය. සංවර්ධනය හා ජනමාධ්‍ය අතර සබඳතාවය පිළිබඳ බටහිර මතවාද ඉදිරිපත් කර ඇති විද්වතුන් දෙදෙනෙකු නම් කර ඉන් එක් අයෙකුගේ අදහස් කරුණු දෙකක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 6)

4) සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘතියක් සඳහා ප්‍රජා සහභාගිත්වය ලබාගැනීමට අනුගමනය කළ යුතු උපක්‍රම හතරක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 8)

06) ජනශ්‍රැතිය යනු ඕනෑම සමාජයකට උරුම වූ හා එම සමාජයේ අනන්‍ය වූ ලක්ෂණ සහිත වූ සංස්කෘතික අංගයකි.

1) ජනශ්‍රැතියේ ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 2)

2) ජනශ්‍රැතිකාංග හතරක් නම් කර, පාසලේ පැවැත්වෙන විවිධ ප්‍රසංගයකදී මෙම ජනශ්‍රැතිකාංග යොදාගනිමින් කළ හැකි නව නිර්මාණ දෙකක් සිදුකරන ආකාරය පැහැදිලි කර දෙන්න. (ලකුණු 4)

3) නිර්මාණකරණයේදී ජනශ්‍රැතිය යොදාගැනීමෙන් අත්වන වාසි තුනක් නම් කරන්න.

(ලකුණු 6)

4) මාධ්‍ය විචාරයේ මූලිකාංග හතරක් නම් කර, මාධ්‍ය විචාරය සමාජයට අවශ්‍ය වන්නේ ඇයිදැයි කරුණු දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 8)

07) 1) පුද්ගලයෙකුගේ මානසික සාමය බිඳ වැටීමෙන් ඇතිවන අයහපත් චර්යා හතරක් නම් කරන්න.

(ලකුණු 2)

2) මාධ්‍ය ප්‍රචණ්ඩත්වය රූපවාහිනී මාධ්‍ය තුළ නිරූපණය වන ආකාර දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 4)

3) ජනප්‍රිය සංස්කෘතිය සමාජය මත ඇතිකරන බලපෑම් තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 6)

4) මාධ්‍ය සාක්ෂරතාවයට අදාළ කුසලතා හතරක් නම් කර, මාධ්‍ය සාක්ෂරතාව සමාජයට අත්පත් කර දිය යුත්තේ ඇයිද යන්න කරුණු දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න.

(ලකුණු 8)

The National e-learning Portal for The General Education